# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2349/41 - 2023 සැප්තැම්බර් මස 16 වැනි සෙනසුරාදා - 2023.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී.277/40(iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

19 වන වගන්තිය යටතේ වූ දැන්වීම

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මා විසින්, එම ආඥාපනතේ කාර්ය සඳහා, මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පැරණි ස්මාරක, "ආරක්ෂිත ස්මාරක" බවට ප්‍රකාශයට පත්කරමින් එම ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2023.10.10 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය.

එවැනි සෑම විරෝධතාවක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, එම හේතු පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතු ය.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

**ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ස්මාරක**

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වක්වැල්ල අංක 121 ග්‍රාම නිලධාරි වසමට අයත් බටුවන්තුඩාව ශ්‍රී සුගතාරාම විහාර භූමියේ පිහිටි මහනුවර යුගයේ සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බතීගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් බතීගම දීඝවාළුකාරාම රජමහා විහාර භූමියේ ඇති පොහොය සීමාව සහ ධර්මශාලාව.

1A - G 40325 — 07 (2023/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 408සී කඹුරුගමුව දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් ගොඩකන්ද ග්‍රාමයේ පිහිටි පුරාණ සමුද්‍රතීර මහ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය, දාගැබ සහ ධර්මශාලාව (උතුරු අක්ෂාංශ 5˚ 56´ 20.5˝ N සහ නැගෙනහිර දේශාංශ 80˚ 30´ 14.4˝ E).

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෝරඹ කනංකෙ උතුර, අංක 372 ග්‍රාම නිලධාරි වසමට අයත් කනංකෙ රජමහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය (උතුරු අක්ෂාංශ 6˚ 0240.4 N සහ නැගෙනහිර දේශාංශ 80˚ 2451.4 E).

5. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගේගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් වගේගොඩ රන්කොත්මළු විහාර භූමියේ ඇති -

   (i) ටැම්පිට විහාර නටබුන් ගොඩැල්ල සහ එහි සිට උතුරට මීටර් 2 සෙ. මී. 50 ක් ද; නැගෙනහිරට, දකුණට හා බටහිරට මීටර් 3 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6˚ 3´ 24.3˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 40´ 57.6˝ E);

   (ii) පැරණි ස්තූපය සහ එහි ප්‍රාකාරයේ සිට උතුරට, නැගෙනහිරට හා දකුණට මීටර් 5 ක් හා බටහිරට ප්‍රාකාර බැම්ම ඇතුළත් වන භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6˚ 3´ 24˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 40´ 59˝ E).

6. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දූනුගම-මාලියද්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාලියද්ද ශ්‍රී සුදර්ශනාරාම විහාරභූමියේ ඇති ටැම්පිට විහාරය (උතුරු අක්ෂාංශ 7˚ 16´ 28˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 27´ 55˝ E).

7. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 48A කෙහෙල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කෙහෙල්වත්ත ශ්‍රී ජයවර්ධන පිරිවෙන් විහාර භූමියේ ඇති ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව, පොහොය ගෙය ලෙස භාවිතා කරන දෙමහල් ගොඩනැගිල්ල සහ එම දෙමහල් ගොඩනැගිල්ලේ සිට සිව් දිශාවට මීටර් 2 බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 7˚ 10´ 28˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 22´ 52˝ E).

8. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුර අංක 54A ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වතුර රජමහා විහාර භූමියේ ඇති බෝධි ප්‍රාකාරය සහ එහි සිට සිව් දිශාවට මීටර් 2 බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 7˚ 11´ 20˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 22´ 32˝ E).

9. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරණගම්පළ අංක 52C ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රංවල පුරාණ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය (උතුරු අක්ෂාංශ 7˚ 15´ 08˝ N හා නැගෙනහිර දේශාංශ 80˚ 19´ 24˝ E),

10. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටහේන නැගෙනහිර අංක 42 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොටහේන ශ්‍රී පරමානන්ද පුරාණ මහා විහාර භූමියේ ඇති පැරණි ධර්මශාලාව, පුස්තකාල ගොඩනැගිල්ල, සන්ධ්‍යාර කුළුණ, චෛත්‍ය, ප්‍රතිමා ගෘහයේ මධ්‍ය කොටස සහ එම එක් එක් ගොඩනැගිලි වටා අඩි 10 කින් යුතු භූමි පරිශ්‍ර (උතුරු අක්ෂාංශ 6˚ 95´ 2˝ N හා නැගෙනහිර දේශාංශ 79˚ 86´ 06˝ E).

11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1042 දඹදෙණිය දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් ගලබොඩ ග්‍රාමයේ මාදන්ගහමුලවත්ත නමැති ඉඩමේ පහත සඳහන් භූගෝලීය ඛණ්ඩාංක මගින් වෙන්කර දක්වා ඇති භූමිය සහිත දඹදෙණි රාජධානියේ පැරණි පිට පවුර ;

| *උතුරු අක්ෂාංශ* | *නැගෙනහිර දේශාංශ* |
|---|---|
| 7˚ 21´ 36.60˝ N | 80˚ 9´ 24.42˝ E |
| 7˚ 21´ 35.90˝ N | 80˚ 9´ 28.37˝ E |
| 7˚ 21´ 37.26˝ N | 80˚ 9´ 33.34˝ E |
| 7˚ 21´ 37.01˝ N | 80˚ 9´ 33.46˝ E |
| 7˚ 21´ 35.59˝ N | 80˚ 9´ 28.35˝ E |
| 7˚ 21´ 36.12˝ N | 80˚ 9´ 24.43˝ E |

EOG 09 - 0121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.